# ශ්‍රී බුද්ධ වර්ෂ 2561-2562

# රාජ්‍ය වර්ෂ 2018



# බුදු සරණ

## දෙළොස් මහේ පොහොය වරුණ

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සච්චන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුන් පොහෝ දිනක ය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන්වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදක ය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි. බක් පොහොය දිනය. මේසුන්දරදිවයින දෙවැනිවරටත් බුදුසිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද, දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද බක් පුර පොහෝ දිනකදී ය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනය යි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවුඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

## 2018 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **දුරුතු මස පෝය** | | | | | | | | | |
| ජන.01 | සඳුදු පූ.භා. | 11.45 | න් | පසළොස්වක ලබා | 02 අඟහ. | පූ.භා.07.56 න් | ගෙවේ. | සඳුදු | සිල් |
| ජන.08 | සඳුදුඅ.භා. | 03.53 | න් | අව අටවක ලබා | 09 අඟහ. | අ.භා.04.21 න් | ගෙවේ. | සඳුදු | සිල් |
| ජන.16 | අඟහ.පූ.භා. | 05.13 | න් | අමාවක ලබා | 17 බදදු | පූ.භා.07.48 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| **නවම් මස පෝය** | | | | | | | | | |
| ජන.24 | බදදු අ.භා. | 04.13 | න් | පුර අටවක ලබා | 25 බ්‍රහස්. | අ.භා.03.10 න් | ගෙවේ. | බදදු | සිල් |
| ජන.30 | අඟහ.අ.භා. | 10.25 | න් | පසළොස්වක ලබා | 31 බදදු | අ.භා.07.00 න් | ගෙවේ. | බදදු | සිල් |
| පෙබ.07 | බදදු පූ.භා. | 08.48 | න් | අව අටවක ලබා | 08 බ්‍රහස්. | පූ.භා.10.16 න් | ගෙවේ. | බදදු | සිල් |
| පෙබ.15. | බ්‍රහස්. පූ.භා. | 00.46 | න් | අමාවක ලබා | 16 සිකුරා. | පූ.භා.02.35න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| **මැදින් මස පෝය** | | | | | | | | | |
| පෙබ.23 | සිකුරා.පූ.භා. | 02.29 | න් | පුර අටවක ලබා | 24 සෙන. | පූ.භා.00.43 න් | ගෙවේ. | සිකුරා. | සිල් |
| මාර්.01 | බ්‍රහස්.පූ.භා. | 09.00 | න් | පසළොස්වක ලබා | 02 සිකුරා. | පූ.භා. 06.23න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| මාර්.09 | සිකුරා පූ.භා. | 03.47 | න් | අව අටවක ලබා | 10 සෙන. | පූ.භා.06.02න් | ගෙවේ. | සිකුරා . | සිල් |
| මාර්.16 | සිකුරා අ.භා. | 06.15 | න් | අමාවක ලබා | 17 සෙන. | අ.භා.06.39 න් | ගෙවේ. | සෙන. | සිල් |
| **බක් මස පෝය** | | | | | | | | | |
| මාර්.24 | සෙන. පූ.භා. | 10.07 | න් | පුර අටවක ලබා | 25 ඉරිදු | පූ.භා.08.04 න් | ගෙවේ. | සෙන. | සිල් |
| මාර්.30 | සිකුරා. අ.භා. | 07.39 | න් | පසළොස්වක ලබා | 31 සෙන. | අ.භා.06.12 න් | ගෙවේ. | සෙන. | සිල් |
| අප්‍රේ.07 | සෙන. අ.භා. | 11.32 | න් | අව අටවක ලබා | 09 සඳුදු | පූ.භා. 02.06 න් | ගෙවේ. | ඉරිදු | සිල් |
| අප්‍රේ.15 | ඉරිදු පූ.භා. | 08.37 | න් | අමාවක ලබා | 16 සඳුදු | පූ.භා. 07.27 න් | ගෙවේ. | ඉරිදු | සිල් |
| **වෙසක් මස පෝය** | | | | | | | | | |
| අප්‍රේ.22 | ඉරිදු අ.භා. | 04.20 | න් | පුර අටවක ලබා | 23 සඳුදු | අ.භා. 02.19 න් | ගෙවේ. | ඉරිදු | සිල් |
| අප්‍රේ. 29 | ඉරිදු පූ.භා. | 06.40 | න් | පසළොස්වක ලබා | 30 සඳුදු | පූ.භා. 06.30 න් | ගෙවේ. | ඉරිදු | සිල් |
| මැයි 07 | සඳුදු අ.භා. | 06.27 | න් | අව අටවක ලබා | 08 අඟහ. | අ.භා. 08.41 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| මැයි 14 | සඳුදු අ.භා. | 07.44 | න් | අමාවක ලබා | 15 අඟහ | අ.භා.05.16 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| **අධි පොසොන් මස පෝය** | | | | | | | | | |
| මැයි 21 | සඳුදු අ.භා. | 10.17 | න් | පුර අටවක ලබා | 22 අඟහ. | අ.භා. 08.35 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| මැයි 28 | සඳුදු අ.භා. | 06.45 | න් | පසළොස්වක ලබා | 29 අඟහ. | අ.භා. 07.54 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| ජුනි 06 | බදදු පූ.භා. | 11.13 | න් | අව අටවක ලබා | 07 බ්‍රහස්. | අ.භා.12.34 න් | ගෙවේ. | බදදු | සිල් |
| ජුනි 13 | බදදු පූ.භා. | 04.35 | න් | අමාවක ලබා | 14 බ්‍රහස්. | පූ.භා.01.13 න් | ගෙවේ. | බදදු | සිල් |
| **පොසොන් මස පෝය** | | | | | | | | | |
| ජුනි 20 | බදදු පූ.භා. | 05.00 | න් | පුර අටවක ලබා | 21 බ්‍රහස්. | පූ.භා.03.54 න් | ගෙවේ. | බදදු | සිල් |
| ජුනි 27 | බදදු පූ.භා. | 08.15 | න් | පසළොස්වක ලබා | 28 බ්‍රහස්. | පූ.භා. 10.25 න් | ගෙවේ. | බදදු | සිල් |
| ජූලි 06 | සිකුරා. පූ.භා. | 01.05 | න් | අව අටවක ලබා | 07 සෙන. | පූ.භා. 01.20 න් | ගෙවේ. | සිකුරා. | සිල් |
| ජූලි 12 | බ්‍රහස්.අ.භා. | 12.02 | න් | අමාවක ලබා | 13 සිකුරා. | පූ.භා. 08.19 න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| **ඇසළ මස පෝය** | | | | | | | | | |
| ජූලි 19 | බ්‍රහස්. අ.භා. | 01.42 | න් | පුර අටවක ලබා | 20 සිකුරා. | අ.භා. 01.25 න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| ජූලි 26 | බ්‍රහස්.අ.භා. | 11.18 | න් | පසළොස්වක ලබා | 28 සෙන. | පූ.භා.01.51 න් | ගෙවේ. | සිකුරා. | සිල් |
| අගෝ.04 | සෙන.අ.භා. | 12.02 | න් | අවඅටවක ලබා | 05 ඉරිදු | පූ.භා. 11.18 න් | ගෙවේ. | සෙන. | සිල් |
| අගෝ.10 | සිකුරා. අ.භා. | 07.08 | න් | අමාවක ලබා | 11 සෙන. | අ.භා. 03.30 න් | ගෙවේ. | සෙන. | සිල් |
| **නිකිණි මස පෝය** | | | | | | | | | |
| අගෝ. 18 | සෙන. පූ.භා. | 01.06 | න් | පුර අටවක ලබා | 19 ඉරිදු | පූ.භා. 01.51 න් | ගෙවේ. | සෙන. | සිල් |
| අගෝ. 25 | සෙන. අ.භා. | 03.16 | න් | පසළොස්වක ලබා | 26 ඉරිදු | අ.භා. 05.25 න් | ගෙවේ. | සෙන. | සිල් |
| සැප්. 02 | ඉරිදු අ.භා. | 08.45 | න් | අව අටවක ලබා | 03 සඳුදු | අ.භා. 07.17 න් | ගෙවේ. | සඳුදු | සිල් |
| සැප්.09 | ඉරිදු පූ.භා. | 02.44 | න් | අමාවක ලබා | එදිනම | අ.භා. 11.34 න් | ගෙවේ. | ඉරිදු | සිල් |
| **බිනර මස පෝය** | | | | | | | | | |
| සැප්. 16 | ඉරිදු අ.භා. | 04.00 | න් | පුර අටවක ලබා | 17 සඳුදු | අ.භා. 05.49 න් | ගෙවේ. | ඉරිදු | සිල් |
| සැප්. 24 | සඳුදු පූ.භා. | 07.18 | න් | පසළොස්වක ලබා | 25 අඟහ. | පූ.භා. 08.22 න් | ගෙවේ. | සඳුදු | සිල් |
| ඔක්.02 | අඟහ. පූ.භා. | 04.10 | න් | අව අටවක ලබා | 03 බදදු | පූ.භා. 02.18 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| ඔක්.08 | සඳුදු පූ.භා. | 11.35 | න් | අමාවක ලබා | 09 අඟහ. | පූ.භා. 09.20 න් | ගෙවේ. | සඳුදු | සිල් |
| **වප් මස පෝය** | | | | | | | | | |
| ඔක්. 16 | අඟහ.පූ.භා. | 10.19 | න් | පුර අටවක ලබා | 17 බදදු | අ.භා. 12.52 න් | ගෙවේ. | අඟහ. | සිල් |
| ඔක්.23 | අඟහ. අ.භා. | 10.34 | න් | පසළොස්වක ලබා | 24 බදදා. | අ.භා. 10.13 න් | ගෙවේ. | බදදු | සිල් |
| ඔක්.31 | බදදු පූ.භා. | 11.11 | න් | අව අටවක ලබා | නොවැ. 01 බ්‍රහස්. | පූ.භා.09.11 න් | ගෙවේ. | බදදු | සිල් |
| නොවැ.06 | අඟහ.අ.භා. | 10.31 | න් | අමාවක ලබා | 07 බදදු | අ.භා. 09.37 න් | ගෙවේ. | බදදු | සිල් |
| **ඉල් මස පෝය** | | | | | | | | | |
| නොවැ. 15 | බ්‍රහස්. පූ.භා. | 07.05 | න් | පුර අටවක ලබා | 16 සිකුරා. | පූ.භා. 09.40 න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| නොවැ. 22 | බ්‍රහස්. අ.භා. | 12.51 | න් | පසළොස්වක ලබා | 23 සිකුරා. | පූ.භා.11.08 න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| නොවැ.29 | බ්‍රහස්. අ.භා. | 06.49 | න් | අව අටවක ලබා | 30 සිකුරා. | අ.භා. 04.58 න් | ගෙවේ. | සිකුරා . | සිල් |
| දෙසැ. 06 | බ්‍රහස්. අ.භා. | 12.16 | න් | අමාවක ලබා | 07 සිකුරා. | අ.භා. 12.55 න් | ගෙවේ. | බ්‍රහස්. | සිල් |
| **උඳුවප් මස පෝය** | | | | | | | | | |
| දෙසැ.15 | සෙන. පූ.භා. | 04.17 | න් | පුර අටවක ලබා | 16 ඉරිදු | පූ.භා. 06.14 න් | ගෙවේ. | සෙන. | සිල් |
| දෙසැ.22 | සෙන. පූ.භා. | 02.08 | න් | පසළොස්වක ලබා | එදිනම | අ.භා. 11.18 න් | ගෙවේ. | සෙන. | සිල් |
| දෙසැ. 29 | සෙන. පූ.භා. | 03.52 | න් | අවඅටවක ලබා | 30 ඉරිදු | පූ.භා. 02.30 න් | ගෙවේ. | සෙන. | සිල් |

## දෙළොස් මහේ පොහොය වරුණ

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි. ඇසළ පෝදු.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයකි. නිකිණි පසළොස්වක පොහෝදු පොහොය කොට නිකිණි අව පෑළවිය පසුවස් එළඹීමයි. සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වස් වසමින් බණ භාවනාවල යෙදෙමින් සම්බුද්ධ ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණි සසුනේ ආරම්භය සිදු විය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වහන්සේ වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින්ද ව්‍යවහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෛත්‍රී බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම, පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ සංඝමිත්තා මහරහත් මෙහෙණීන් වහන්සේගේ ලංකාගමනය ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන, ලංකා මෙහෙණි සසුන ගැන සිහිකරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

වර්ෂ 2018 ක්වූ ජනවාරි 01 වනදා සඳුදු කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී. SAMAN SRIKANTHA